# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2381/30 – 2024 අප්‍රේල් මස 25 වැනි බ්‍රහස්පතින්දා – 2024.04.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2020/114.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

කේ. එම්. එන්. කරුණාතිලක මයා, අංක 67, ජයසෙන්ගම, කුඹුක්කන, මොනරාගල

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, කොස්වත්ත, රිච්ඩ් ද සොයිසා නිවාස සංකීර්ණය, අංක 04, නීතිඥ පියල් දර්ශන ගුරුගේ මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනුෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 අප්‍රේල් මස 17 වැනි දින,
කොළඹ දී ය.

1A – G41819 – 14 (2024/04)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/2020/114.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

කේ. එම්. එන්. කරුණාතිලක මයා, අංක 67, ජයසෙන්ගම, කුඹුක්කන, මොනරාගල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවක කේ. එම්. එන්. කරුණාතිලක මහතාට විරුද්ධව පැවති විනය පරීක්ෂණයේදී ශ්‍රී ලංගම/මාසික/විනය/111/2020 හා 2020.01.17 දිනැති විනය නියෝගය පරිදි සියලු චෝදනාවන්ට නිවැරදිකරු වී තිබියදී පහත සඳහන් කරුණු මගින් ඔහුට අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයක් කවරේ ද යන්නත් පිළිබඳව වේ.''

කේ. එම්. එන්. කරුණාතිලක මහතාට සී/ස ඌව බස් සමාගමේ සේවක මණ්ඩල කළමනාකරුගේ අංක සීස/ඌබස/සේමකො/04-03/2004 හා 2004.11.10 දිනැති ලිපිය මගින් ලබා දී ඇති ii ශ්‍රේණියේ ඩිපෝ කළමනාකාර තනතුර ශ්‍රී ලංගම/බඳු/ප්‍රාකා/මුදල්/2017/05 හා 2017.12.01 දිනැති ලිපිය මගින් එම තනතුර වංචනිකව ලබාගත් එකක් බව පවසා ii ශ්‍රේණියේ ඩිපෝ කළමනාකරු තනතුරට ගෙවන ලද වැටුප ආපසු අයකර ගැනීම.

ii ශ්‍රේණියේ ඩිපෝ කළමනාකාර තනතුරේ වැටුප් නොලබා එම තනතුරේ රාජකාරි කිරීමට සැළැස්වීම.

2004 වර්ෂයේ සිට විශ්‍රාම යන දිනය තෙක් වැටුප් වර්ධක හා අනෙකුත් දීමනා හිමි ද හිමි නම් ඒවා ලබා නොදීම''.

**එම්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල් (*වැ.බ.*).

2024 මාර්තු මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 04 - 0202

මගේ අංකය: IR/COM/03/J/2016/23.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

ජී. නන්දසිරි මහතා, ''දේශානි'', උඩවෙලවත්ත, නරවැල්පිට නැගෙනහිර, හක්මණ

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.
2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, හක්මණ ඩිපෝව, මුලටියන.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, රාජගිරිය, ඔබේසේකරපුර, ඇසළ උද්‍යාන පාර, අංක 46/7, අහමඩ් ලෙබ්බේ මොහමඩ් සලීම් මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනුෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 අප්‍රේල් මස 17 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/J/2016/23.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

ජී. නන්දසිරි මහතා, ''දේශානි'', උඩවෙලවත්ත, නරවැල්පිට නැගෙනහිර, හක්මණ

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.
2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, හක්මණ ඩිපෝව, මුලටියන.

සහ

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කරන ජී. නන්දසිරි මහතා අතින් 2021 වර්ෂයේ සිදු වූ රිය අනතුරක් හේතුවෙන් ලබා දී ඇති දඬුවම් මගින් ජී. නන්දසිරි මහතාට අසාධාරණයක් සිදුව තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.''

**එම්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල් (*වැ.බ.*).

2024 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG04 - 0203